# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2455/07 - 2025 සැප්තැම්බර් මස 22 වැනි සඳුදා - 2025.09.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(X)(ඇ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන සහ 70ඇ වන  වගන්ති සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති ජීඑල් 00303869, ලියාපදිංචි අංකය දරන, සමාගමක් වන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට්, (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70 ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා, මෙහි I වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති සහ II වන තීරයේ ඊට අනුරූප සටහන්වල එහි කෙටි යෙදුම් දක්වා ඇති උපාධි සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා මෙහි I වන උපලේඛනයේ III වන තීරයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව ප්‍රදානය කිරීම සඳහා, මෙහි  II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති *අති විශෙෂ ගැසට්පත්‍රවල* පළකරන ලද නියමයන් මගින් ඒ නියමයන්හි දැක්වෙන උපාධි සහ ඩිප්ලෝමා සම්බන්ධයෙන් නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිඩට් ආයතනය සතුව පවතින උපාධි පිරිනැමීමේ තත්ත්වය නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට්, (ගැරන්ටී) ලිමිටඩ් ආයතනය වෙත ප්‍රදානය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| ව්‍යාපාර සන්නිවේදනය පිළිබඳ කලා උපාධිය | බී ඒ (ව්‍යාපාර සන්නිවේදනය)<br>BA (Business Communication) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |


1A - PG 7257 - 284  (2025/09)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**I වන උපලේඛනය** (*සම්බන්ධිතයි*)

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| බහුමාධ්‍ය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | බී එස් සී (බහුමාධ්‍ය)<br>BSc (Multimedia) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (මානව සම්පත් කළමනාකරණය) (විශේෂ) උපාධිය | බී එස් සී බී එම් (එච් ආර් එම්) විශේෂ<br>BSc BM (HRM) Sp. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (කාර්ය සම්පාදන කළමනාකරණය) (විශේෂ) උපාධිය | බී එස් සී බී එම් (එල් එම්) (විශේෂ)<br>BSc BM (LM) Sp. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (කර්මාන්ත කළමනාකරණය) (විශේෂ) උපාධිය | බී එස් සී බී එම් (අයි එම්) (විශේෂ)<br>BSc BM (IM) Sp. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ව්‍යාපෘති කළමනාකරණය) (විශේෂ) උපාධිය | බී එස් සී බී එම් (පී එම්) (විශේෂ)<br>BSc BM (PM) Sp. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | බී එස් සී (එම් අයි එස්) විශේෂ<br>BSc MIS Sp. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |

**I** වන උපලේඛනය (*සම්බන්ධිතයි*)

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (බී එම්)<br>PG Dip (BM) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (එච් ආර් එම්)<br>PG Dip (HRM) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| කර්මාන්ත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (අයි එම්)<br>PG Dip (IM) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (පී එම්)<br>PG Dip (PM) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| පරිගණක ජාල පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (සී එන්)<br>PG Dip (CN) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (එස් ඊ)<br>PG Dip (SE) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම් ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) තිබීම. |
| ව්‍යාපාර පරිපාලනපති | එම් බී ඒ | |
| ව්‍යාපාර අධ්‍යයනපති | එම් බී එස් | |

**I වන උපලේඛනය** (*සම්බන්ධිතයි*)

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| විද්‍යාවේදී ගෞරව මෘදුකාංග ඉංජිනේරු | බී එස් සී ගෞරව<br>(සොෆ්ට්වෙයා ඉංජිනියරින්) | |
| ගිණුම්කරණය සහ මුදල් කළමනාකරණ ගෞරව | බී එම් ගෞරව(ඒ සී සී සහ එෆ් අයි එන්) | |
| පරිගණක පද්ධති ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව | බීඑස්සී ඉංජිනේරු (ගෞරව)<br>(පරිගණක පද්ධති ඉංජිනේරු) | අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම සුදුසුකම් ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් තිබීම. |
| අභ්‍යන්තර නිර්මාණවේදය | බී අයි එන් ටී ඩී ඊ එස් | අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂයය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකම තිබීම. |
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී එස් සී ගෞරව (පරිගණක විද්‍යාව) | (අ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ<br>(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් පදනම් පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම,<br>යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමක් තිබීම. |
| පරිගණක ජාලකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී එස් සී ගෞරව<br>(පරිගණක ජාලකරණය) | (අ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ<br>(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් පදනම් පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම,<br>යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමක් තිබීම. |

**I වන උපලේඛනය** (*සම්බන්ධිතයි*)

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බී එම් ජී ටී ගෞරව (ජාත්‍යන්තර ව්‍යාපාර) | අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂයය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකම තිබීම. |
| විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව | බී එස් සී ඉංජිනේරු (ගෞරව) (විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු) | අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී භෞතිකවිද්‍යා විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම තිබීම. |
| මෙකාට්‍රොනික් ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව | බී එස් සී ඉංජිනේරු (ගෞරව) (මෙකාට්‍රොනික් ඉංජිනේරු) | අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතිකවිද්‍යා විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමක් තිබීම. |
| සංචාරක, සත්කාර සහ සිදුවීම් පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී | බී බී එම් (සංචාරක, සත්කාර සහ සිදුවීම්) | (අ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ<br><br>(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇදුනු පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම,<br><br>යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමක් තිබීම. |
| ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී එස් සී ගෞරව (ජෛව වෛද්‍ය විද්‍යාව) | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස්පෙළ) විභාගයේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව හෝ කෘෂිකාර්මික විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම තිබීම. |

**I වන උපලේඛනය (*සම්බන්ධිතයි*)**

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| පෝෂණය සහ සෞඛ්‍යය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී එස් සී ගෞරව<br>(පෝෂණය සහ සෞඛ්‍යය) | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස්පෙළ) විභාගයේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව හෝ කෘෂිකාර්මික විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම තිබීම. |
| දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී එස් සී ගෞරව<br>(දත්ත විද්‍යාව) | (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස්පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ<br><br>(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කර ලද එයට ඇදුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම,<br><br>යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමක් තිබීම. |
| කළමනාකරණය පිළිබඳ ආචාර්ය | පී එච් ඩී (කළමනාකරණය) | (අ) කළමනාකරණය හෝ වෙනත් යම් සම්බන්ධිත ක්ෂේත්‍රයක දර්ශනපති උපාධියක් ලබා තිබීම ; හෝ<br><br>(ආ) කළමනාකරණය හෝ වෙනත් යම් සම්බන්ධිත ක්ෂේත්‍රයක ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවේ 10 වන ස්ථරයේ (එස්.එල්.කිවු.එෆ්.10) දැක්වෙන අවශ්‍යතා සපුරාලනු ලබන දර්ශනපති උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම,<br><br>යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමක් තිබීම. |

**I වන උපලේඛනය (*සම්බන්ධිතයි*)**

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණ ගෞරව | බී එම් ජී ටී ගෞරව<br>(ව්‍යාපාර විශ්ලේෂණය) | (i) (එස්. එල්. කිවු. එෆ්. 6 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණකර තිබීම ; සහ<br><br>(ii) (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ දී වාණිජ්‍ය විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ<br><br>(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කර ලද එයට ඇදුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම,<br><br>යන අවම ඇතුළත්වීමේ සුදුසුකමක් තිබීම. |
| ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ කළමනාකරණ ගෞරව | බී එම් ජී ටී ගෞරව<br>(ව්‍යවහාරික ආර්ථික විද්‍යාව) | (i) (එස්. එල්. කිවු. එෆ්. 6 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණ කර තිබීම ; සහ<br><br>(ii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍යය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් තිබීම. |
| නීතිවේදී ගෞරව | එල් එල් බී ගෞරව | (i) (එස්. එල්. කිවු. එෆ්. 6 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණකර තිබීම ; සහ<br><br>(ii) (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය ධාරාවක් යටතේ සම්මාන සාමාර්ථ (C) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; සහ |

**I වන උපලේඛනය (*සම්බන්ධිතයි*)**

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| | | (ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ ඒ හා සමාන ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පිළිගනු ලබන විභාගයකදී ඉංග්‍රීසි භාෂාව සහ සිංහල හෝ දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථ (C) තුනක් (3) සහිතව සාමාර්ථ හයක් (6) එකවර ලබා තිබීම,<br><br>යන අවම ඇතුළත්වීමේ සුදුසුකම ලබා තිබීම. |
| ඖෂධ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී එස් සී ගෞරව<br>(ඖෂධ විද්‍යාව) | (i) (එස්. එල්. කිව්. එෆ්. 6 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණකර තිබීම ; සහ<br><br>(ii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම තිබීම. |
| නීතිය සහ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍ය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බී එම් ගෞරව<br>(නීතිය සහ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍ය) | (i) (එස්. එල්. කිව්. එෆ්. 6 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණකර තිබීම ; සහ<br><br>(ii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් වීමේ සුදුසුකම් තිබීම. |

**I වන උපලේඛනය (*සම්බන්ධිතයි*)**

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| නීතිය සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බී එම් ගෞරව<br>(නීතිය සහ ජාත්‍යන්තර වෙළඳාම) | (i) (එස්. එල්. කිවු. එෆ්. 6 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණකර තිබීම ; සහ<br><br>(ii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය ධාරාවක් යටතේ සාමාර්ථ සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් වීමේ සුදුසුකම් තිබීම. |
| අලෙවි කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බී එම් ගෞරව<br>(අලෙවි කළමනාකරණය) | (i) (එස්. එල්. කිවු. එෆ්. 6 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණකර තිබීම ; සහ<br><br>(ii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් තිබීම. |
| නීතිය සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බී එම් ගෞරව<br>(නීතිය සහ ව්‍යාපාර අධ්‍යයනය) | (i) (එස්. එල්. කිවු. එෆ්. 6 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණකර තිබීම ; සහ<br><br>(ii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් වීමේ සුදුසුකම් තිබීම. |

**I වන උපලේඛනය** (*සම්බන්ධිතයි*)

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| අධ්‍යාපන කළමනාකරණය සහ නායකත්වය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය | එම්එඩ්<br>(අධ්‍යාපන කළමනාකරණය හා නායකත්වය) | (i) (එස්. එල්. කිවු. එෆ්. 10 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 60ක් සහිතව සම්පූර්ණ කර තිබීම ; සහ<br><br>(ii) (අ) අදාළ විෂය ක්ෂේත්‍රයෙන් අධ්‍යයන සම්භාර 30ක් ඇතුළත් වන පරිදි ප්‍රථම උපාධියක් ලබා තිබීම; හෝ<br><br>(ආ) අදාළ විෂය ක්ෂත්‍රයෙන් එස්. එල්. කිවු. එෆ්. සය වන ස්ථරය හෝ ඉහළ ස්ථරයක යෝග්‍යතාවයක් ලබා තිබීම ; හෝ<br><br>(ඇ) එස්. එල්. කිවු. එෆ්. සය වන ස්ථරය හෝ ඉහළ ස්ථරයකට සමාන වන වෘත්තීය යෝග්‍යතාවයක් ලබා තිබීම ; හෝ<br><br>(ඈ) එම විශේෂවේදී ක්ෂේත්‍රයට ඇතුළත්වීම සඳහා සලකනු ලැබිය හැකි, උසස් අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන ආයතනයේ අධ්‍යයන අධිකාරිය විසින් නියම කරන ලද පරිදි 0 - 4 පරිමාණයෙන් අවම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය 3.0 සමග එන්.වී.කිවු. හත්වන ස්ථරය සම්පූර්ණ කර තිබීම. |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය | එම් අයි ටී | (i) (එස්. එල්. කිවු. එෆ්. 9 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 30ක් සහිතව සම්පූර්ණ කර තිබීම ; සහ<br><br>(ii) (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ගෞරව උපාධියක් සමග පශ්චාත් අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් අවම වශයෙන් වසරක සුදුසු සේවා පළපුරුද්දක් ලබා තිබීම ; හෝ<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් උපාධියක් සමග පශ්චාත් අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් අවම වශයෙන් වසර දෙකක සුදුසු සේවා පළපුරුද්දක් ලබා තිබීම ; හෝ |

**I වන උපලේඛනය** (*සම්බන්ධිතයි*)

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| | | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂයයභාර අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන එස්. එල්. කිවු. එෆ්. අට වන ස්ථරය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලබන නිර්ණායක සපුරාලනු ලබන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමග පශ්චාත් අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර දෙකක සුදුසු සේවා පළපුරුද්දක් ලබා තිබීම ;<br>හෝ<br><br>(ඈ) පශ්චාත් උපාධිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම,<br><br>යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්තිබීම. |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | එම් එස් සී (අයි ටී) | (i) (එස්. එල්. කිවු. එෆ්. 10 වන ස්ථරය) අවම අධ්‍යයන සම්භාර 60ක් සහිතව සම්පූර්ණ කිරීම ;<br>සහ<br><br>(ii) (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ගෞරව උපාධියක් සමග පශ්චාත් අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් අවම වශයෙන් වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම ; හෝ<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් උපාධියක් සමග පශ්චාත් අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් අවම වශයෙන් වසර දෙකක සුදුසු සේවා පළපුරුද්දක් ලබා තිබීම ;<br>හෝ |

**I වන උපලේඛනය** (*සම්බන්ධිතයි*)

| *I වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br>*උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| | | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂයයභාර අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන එස්. එල්. කිවු. එෆ්. අට වන ස්ථරය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලබන නිර්ණායක සපුරාලනු ලබන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමග පශ්චාත් අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර දෙකක සුදුසු සේවා පළපුරුද්දක් ලබා තිබීම ; හෝ<br><br>(ඈ) පශ්චාත් උපාධි සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම,<br><br>යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් තිබීම. |

**II වන උපලේඛනය**

01. 2016 ජනවාරි මස 19 වැනි දින අංක 1950/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
02. 2016 ජූලි මස 14 වැනි දින අංක 1975/48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
03. 2018 ජනවාරි මස 11 වැනි දින අංක 2053/40 දරන දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
04. 2018 අප්‍රේල් මස 19 වැනි දින අංක 2067/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
05. 2019 මැයි මස 02 වැනි දින අංක 2121/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
06. 2019 මැයි මස 29 වැනි දින අංක 2125/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
07. 2019 දෙසැම්බර් මස 30 වැනි දින අංක 2156/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
08. 2020 පෙබරවාරි මස 27 වැනි දින අංක 2164/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
09. 2021 අප්‍රේල් මස 22 වැනි දින අංක 2224/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
10. 2022 පෙබරවාරි මස 25 වැනි දින අංක 2268/87 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
11. 2022 අගෝස්තු මස 25 වැනි දින අංක 2294/52 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
12. 2022 ඔක්තෝබර් මස 19 වැනි දින අංක 2302/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
13. 2023 පෙබරවාරි මස 20 වැනි දින අංක 2320/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
14. 2023 ජූලි මස 17 වැනි දින අංක 2341/08 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
15. 2023 සැප්තැම්බර් මස 07 වැනි දින අංක 2348/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
16. 2023 නොවැම්බර් මස 03 වැනි දින අංක 2356/32 දර*අති විශෙෂ ගැසට් පත්‍රය*

17. 2024 මැයි 08 වැනි දින අංක 2383/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
18. 2024 ජූලි මස 11 වැනි දින අංක 2392/47 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය*

නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු සමාලෝචනයට යටත්ව මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

මෙහි I වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපාධි සඳහා උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය වෙත ලබා දෙමින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති *ගැසට් පත්‍ර*වල පළ කරන ලද නියම, ඒ යටතේ නීත්‍යානුකූලව සිදු කරන ලද කිසිවකට අගති රහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0210

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.